**කිතුල් සංවර්ධන මණ්ඩලය - 2025**

**--------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **මතය**

කිතුල් සංවර්ධන මණ්ඩලයේ (“මණ්ඩලය”) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම්/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ,1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2** **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි මණ්ඩලයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2025 දෙසැම්බර් 31 දිනට රු.1,202,977ක ස්ථාවර වත්කම් පැවති නමුත් මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙළ කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.147,953 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,063,835 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.915,882 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර ප්‍රදාන රු. 14,822,920කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | සමාලෝචිත වර්ෂය රු. | ඉකුත් වර්ෂය රු. | ඉකුත් වර්ෂය සමඟ වෙනස් වීම රු. | වෙනස්වීමේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන | 26,933,211 | 12,110,291 | 14,822,920 | 122 |
| වෙනත් ආදායම් | 94,272 | 313,055 | (218,783) | (70) |
| වැටුප්, වේතන හා සේවක | 11,407,572 | 6,733,502 | 4,674,070 | 69 |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රතිලාභ | | | | |
| සැපයුම් හා නඩත්තු සේවා වියදම් | 3,837,021 | 2,280,573 | 1,556,449 | 68 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදාන රු. 26,933,211 ක් එනම් පසුගිය වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන සියයට 122 කින් වැඩි වී තිබුණු නමුත් වර්ෂය සඳහා ඉලක්කගත ව්‍යාපෘති 07ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කළ රු. 20,000,000 ක මුදලින් රු. 7,940,000ක් හෙවත් සියයට 40 ක් උපයෝජනය කර නොතිබුණි.

(ii) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් රු. 218,783 කින් හෙවත් සියයට 70 කින් අඩුවී තිබුණි. ව්‍යාපෘති සඳහා ලබා දුන් මුදල් පෙර වර්ෂයට සාපේක්ෂව අඩුවෙන් ඉතිරි වීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සම්මත ජංගම වත්කම් අනුපාතය 2:1 අනුපාතයක පැවතිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ජංගම වත්කම් අනුපාතය 0.002:1 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එම අගය 0.25:1ක් විය. ජංගම වත්කම් රු. 323,965 කින් අඩුවීම ජංගම වත්කම් අනුපාතය පිරිහීමට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2026 පෙබරවාරි 26 දින සාම්පල පරීක්ෂණ වාර්තාව ලැබී තිබුණද 2026 අප්‍රේල් 30 විගණිත දින වන විටත් වෙළෙඳපොල විමර්ශනයක් සිදු කර නොමැති බවත්, කිතුල් පැණි හා කිතුල් හකුරු වෙනුවෙන් දැනට සකස් කර ඇති ප්‍රමිතීන් සඳහා වලංගු නීතිමය තත්ත්වය ගැසට් පත්‍රයක් මගින් වලංගුතාවයට පත් කිරීම සඳහා කටයුතු කර නොමැති අතර, මේ සඳහා දරන ලද වියදම රු. 3,008,659ක් විය. | මෙවැනි කාර්යයක් සිදුකරන ප්‍රථම අවස්ථාව බැවින් වෙළෙඳපොල විමර්ෂණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය කාර්යයන් මේවන විට සිදු කරමින් පවතී. තවද, මෙම වාර්තාව පදනම් කර ඉදිරියේදී තවත් කමිටු කිහිපයක් පවත්වා දැනට පවතින වෙළෙඳපොල තත්ත්වයන් අධ්‍යයනය කරමින් ප්‍රමිති ආයතනයේ හා පාරිභෝගික සේවා අධිකාරියේ සහායෙන් විශේෂ වෙළෙඳපොල කැළඹීම් මගහරවමින් ගැසට් පත්‍රයක් ප්‍රසිද්ධ කිරීම කටයුතු කරනු ලබන බව. | කිතුල් පැණි සහ හකුරු සම්බන්ධ ප්‍රමිතීන් බලාත්මක කිරීම සඳහා වන ගැසට් නිවේදනය නිකුත් කිරීමටත්, ප්‍රමාද වී ඇති වෙළෙඳපොළ විමර්ශන කඩිනමින් අවසන් කිරීමටත් පියවර ගත යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදර්ශ වගාව සඳහා සුදුසු ඉඩමක් හඳුනාගෙන එය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ එක් කිතුල් පැල තවානක් ආරම්භ කිරීම හා එක් ආදර්ශ | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගම සමග ඒකාබද්ධව හෙක්ටයාර් 5 ක කිතුල් පැල සිටුවන ලද බව. | අපේක්ෂිත ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වගාවක් සංවර්ධනයටත් කිතුල් පැල 25,000ක් සිටුවීම සඳහා රු. 800,000 ක් වෙන් කර තිබුණද එයින් රු. 100,000 ක් පමණක් වියදම් කර තිබුණි. | | |
| (ආ) | කිතුල් ආශ්‍රිත ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය යටතේ වූ උපකරණ ආධාර ලබා දීම සහ නිෂ්පාදන පහසුකම් වැඩි දියුණු කිරීම සහ සම්බන්ධීකරණය සඳහා වෙන් කරන ලද රු.2,500,000 ක් ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | මෙහිදී කිතුල් මල් මදින කාර්මිකයන් සඳහා කිතුල් මදින පිහියක් ලබා දීමට සැලසුම් කරන ලද අතරසුදුසු පිහියක් වෙළඳ පොළ තුල මිලදී ගැනීමට නොතිබුණු බව. | අපේක්ෂිත ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | අලෙවි ප්‍රවර්ධන හරහා වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ උපායමාර්ග ස්ථාන දෙකක වෙළඳසැල් ස්ථාපිත කිරීම හා කිතුල් ආශ්‍රිත සූප ශාස්ත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා රු. 1,870,000 ක් වෙන් කර තිබුණද ඉන් රු. 470,000 ක් පමණක් වියදම් කර තිබුණි. | ජාතික ශිල්ප සභාව විසින් සීගිරිය ප්‍රදේශයේ පිහිටි සීගිරිය ශිල්ප හා සංස්කෘතික ගම්මානයෙන් මෙම මණ්ඩලය වෙත වෙළඳ කුටියක් ලබාදීම සඳහා අනුමැතිය හිමිවී ඇති බව. | අපේක්ෂිත ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.1.3 ප්‍රකාරව වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා වශයෙන් වර්ගීකරණය කරන ලද සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් 2025 වර්ෂය සඳහා මණ්ඩලය ඊට අනුරූපී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2025 වර්ෂය සඳහා කෙටුම්පත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරන ලදී. තවද 2026 -2028 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම, 2026 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව. | මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. |
| (ආ) | 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.17 ප්‍රකාරව භාණ්ඩ හා වැඩ කොන්ත්‍රාත් සඳහා පමණක් අත්තිකාරම් ගෙවීම් කළ හැකි අතර උපදේශන නොවන සේවා සඳහා වූ ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර අත්තිකාරම් ගෙවීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත්ව නොතිබුණි. නමුත් තාක්ෂණික ඇගයීම් කමිටු හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශ මත පර්යේෂණ ව්‍යාපෘති | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත විය යුතුය. |

| | | |
|---|---|---|
| ආරම්භ කිරිම සඳහා අවශ්‍ය මූලික මුල්‍ය ප්‍රතිපාදන ලෙස ඉදිරිපත් කළ මිලෙන් සියයට 66ක මුදලක් ලබා දී තිබුණි. | | |

### 3.4 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක ඉදිකර තිබුණු ගොඩනැගිල්ලක 2022 වර්ෂයේ සිට කිතුල් නිෂ්පාදන අලෙවිසැලක් පවත්වා තිබූ අතර මණ්ඩලය විසින් 2023 හා 2024 වර්ෂවල රු.1,879,737 ක් වැය කර එම ගොඩනැගිල්ලේ අලුත්වැඩියාවක් කර තිබුණද ගොඩනැගිල්ල කිසිදු ආර්ථීක කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අමාත්‍යාංශ නිලධාරීන්, කිතුල් මණ්ඩලයේ නිලධාරීන් සහ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් සමඟ එක්ව ඉතා ඉක්මනින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව. | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිතුල් සංවර්ධන මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 20 දින අනුමත කර තිබුණු නමුත්, කාර්ය මණ්ඩලයේ, සහකාර/නියෝජ්‍ය කළමනාකරු තනතුරු 02ක, පර්යේෂණ හා සංවර්ධන සහකාර තනතුරු 17ක් හා කළමනාකරණ සහකාර තනතුරු 04ක් පුරප්පාඩු වී පවතින බවද සාමාන්‍යාධිකාරි තනතුර, අභ්‍යන්තර විගණක තනතුර, පරිපාලන තනතුර හා ගිණුම් නිලධාරි තනතුරේ රාජකාරි වැඩබලන නිලධාරීන් විසින් ඉටු කර තිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය ඉල්ලීම් රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | මණ්ඩලයේ කාර්යයන් නිසි ලෙස ඉටු කරවා ගැනීමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් නොපමාව සිදු කළ යුතුය. |

### 3.6 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලැබී තිබූ වාහන 02 ක් තක්සේරු කර මණ්ඩලය වෙත පවරා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | මේ දක්වා වාහන පවරා ගෙන නොමැති බව. | මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් ගත වීමට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වාර්ෂික වාර්තාවද මේ දක්වා සභාගත කර නොතිබුණි. | 2022 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2026/03/14 දින අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**4.2 අරමුණු සහ සංයුක්ත සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ ඇමුණුම 01 හි 01 ඡේදය හා මාර්ගෝපදේශ අත්පොතේ 2.3 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් 2025 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. නමුත් සංයුක්ත සැලැස්ම සකස් කිරීම සඳහා 2024 හා 2025 වර්ෂ වලදී රු.1,146,905 ක් වැය කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත ආකෘතියට අනුකූලව සංයුක්ත සැලැස්ම සකස් කළ යුතුය. |
| (ආ) | කිතුල් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාළ 2021 මාර්තු 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව මණ්ඩලයෙන් ඉටු කිරීමට අපේක්ෂිත කිතුල් වගාවන් සිදු කරන ඉඩම්වල සත්ව පාලනයේ නියැලීම | මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්ජා කොට ඉදිරි කටයුතු කරන බව. | කිතුල් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීමේ මූලික අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කාර්යයන් ක්‍රියාත්මක |

| | | |
|---|---|---|
| ප්‍රවර්ධනය කිරීම, කිතුල් වගාවන්වල පොල් සහ අනෙකුත් භෝග වගා කිරීම සම්බන්ධ ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම යන කාර්යයන් ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව ආයතනික යහපාලනය පිලිබඳ මාර්ගෝපදේශයේ ඇමුණුම 01 හි 02 ඡේදය හා මාර්ගෝපදේශ අත්පොතේ 2.3 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් 2025 වර්ෂය සඳහා විගණනය සඳහා ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මෙහි ආයතනයේ අරමුණු, උපායමාර්ග, ක්‍රියාකාරකම්, මාසික ඉලක්ක හා වගකිව යුතු නිලධාරීන් ඇතුලත් කර නිවැරදි ආකෘතියට අනුකූලව නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |

## 4.4 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව 2015-2030 කාලය තුළ ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව එක් එක් රාජ්‍ය ආයතන බැඳී පවතී .ඒ අනුව මණ්ඩලයට ගැළපෙන තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක පැහැදිලිව හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි . | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගත යුතුය. |